තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය Information Communication Technology තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය Information Communication Technology Sudesh Priyankara සුදේශ් ප්‍රියංකර Sudesh Priyankara සුදේශ් ප්‍රියංකර Sudesh Priyankara සුදේශ් ප්‍රියංකර Sudesh Priyankara සුදේශ් ප්‍රියංකර Sudesh Priyankara තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය Information Communication Technology Sudesh Priyankara සුදේශ් ප්‍රියංකර Sudesh Priyankara සුදේශ් ප්‍රියංකර Sudesh Priyankara සුදේශ් ප්‍රියංකර Sudesh Priyankara

# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

## 10 ශ්‍රේණිය - දෙවන පාඩම - පරිගණකය හඳුනා ගනිමු

**ICT** | **නම** :-........................................................................................ | **අධ්‍යාපන ආයතනය** :- …………………..

Sudesh Priyankara

1. ආචයන උපක්‍රම ඒවායේ ප්‍රවේශ වේගයන්ට අනුව අඩු ම වේගයේ සිට වැඩිම වේගය දක්වා අනුපිළිවෙළට දැක්වෙන්නේ.?
   a) නම්‍ය තැටි (floppy disk), දෘඪ තැටි (hard disk), ප්‍රධාන මතකය (main memory)
   b) දෘඪ තැටි, නම්‍ය තැටි, ප්‍රධාන මතකය
   c) දෘඪ තැටි, ප්‍රධාන මතකය, නම්‍ය තැටි
   d) ප්‍රධාන මතකය, දෘඪ තැටි, නම්‍ය තැටි
2. සිසුවෙකු වදන් සකසන මෘදුකාංගයක් භාවිතයෙන් වාර්තාවක් පිළියෙල කරයි. මෙම වාර්තාවේ මෘදු පිටපතට මුද්‍රිත පොතක ඇති පින්තූරයක් ඇතුළත් කිරීමට වඩාත් ම සුදුසු උපක්‍රමය වන්නේ කුමක් ද.?
   a) යතුරු පුවරුව ( Keyboard )
   b) මූසිකය ( Mouse )
   c) මුද්‍රකය ( Printer )
   d) සුපරීක්සකය ( Scanner )
3. පහත දක්වා ඇති නූතන ආචයන මාධ්‍ය ධාරිතාව වැඩිවන අනුපිළිවලට දැක්වෙන්නේ පහත කුමක ද.?
   a) සංයුක්ත තැටි ( CD ) / සංඛ්‍යාංක බහුවිධ තැටි ( DVD ) / දෘඪ තැටි ( Hard disk )
   b) සංඛ්‍යාංක බහුවිධ තැටි / සංයුක්ත තැටි / දෘඪ තැටි
   c) සංඛ්‍යාංක බහුවිධ තැටි / දෘඪ තැටි / සංයුක්ත තැටි
   d) දෘඪ තැටි / සංයුක්ත තැටි / සංඛ්‍යාංක බහුවිධ තැටි
4. පරිගණක සසම්භාවී පිවිසුම් මතක ධාරිතාව 4 GB වේ. එම මතක ධාරිතාවය සමාන වන්නේ.?
   a) 4096 bytes
   b) 4096 KB
   c) 4096 MB
   d) 4096 TB
5. මෘදුකාංගයක් ක්‍රියාත්මක වන විට එහි උපදෙස් සහ දත්ත ................. සිට වාරක මතකය හරහා මධ්‍ය සැකසුම් ඒකකය වෙත සෘජුවම ගෙන එනු ලැබේ. හිස්තැන සඳහා වඩාත් සුදුසු වනුයේ.?
   a) සංයුක්ත තැටියේ
   b) දෘඪ තැටියේ
   c) ප්‍රධාන මතකයේ
   d) පරිගණක ජාලයේ
6. පහත දැක්වෙන උපක්‍රම සලකා බලන්න

   A – අංකිත කැමරාව          B – ස්පීකරය          C - දෘඪ තැටිය

පහත දැක්වෙන උපාංග අතුරින් ආදාන උපාංග පමණක් ඇතුල් වන්නේ ?

   a) A පමණි
   b) B පමණි
   c) A හා B පමණි
   d) B හා C පමණි
7. මධ්‍ය සැකසුම් ඒකකයේ දී ක්‍රමලේඛයක් ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් පහත සඳහන් කවරක් නිවැරදි වන්නේ ද.?
   a) උපදෙස් හා දත්ත ප්‍රධාන මතකයෙන් රැගෙන එනු ලබයි.
   b) උපදෙස් ප්‍රධාන මතකයෙන් රැගෙන එනු ලබන අතර ද්විතීයික ආචයනයෙන් රැගෙන එනු ලබයි.

c) උපදෙස් ද්විතීයික ආචයනයෙන් ගෙන එනු ලබන අතර දත්ත ප්‍රධාන මතකයෙන් රැගෙන එනු ලබයි.
d) උපදෙස් හා දත්ත ද්විතීයික ආචයනයෙන් රැගෙන එනු ලබයි.

8. මහනුවර වාසය කරන කසුන් ඔහුගේ පරිගණකය මගින් සංඛ්‍යාංක චිත්‍රයක් සකසනු ලබන්නේ ප්‍රතිබිම්බ ගොනුවක් ලෙස ය. කොළඹ යාපනය ඉන්දියාව හා ජපානය යන ස්ථාන වල වෙසෙන ඔහුගේ මිතුරන් සතර දෙනකුට මෙම චිත්‍රය දැක බලා ගැනීමට සුදුසු වන්නේ.
A – මිතුරන්ගේ පරිගණක වලට ගොනුව යැවීම සඳහා ස්ථානීය පෙදෙස ජාලයක් හරහා ගොනු තැන්මාරු ( File Transfer ) මෘදුකාංගයක් භාවිතා කිරීම
B – විද්‍යුත් තැපැල් ( Email ) භාවිතය
C – අදාළ ගොනුව USB සැනෙලි මතක ධාවක හතරකට පිටපත් කර ඒවා සාමාන්‍ය තැපැලෙන් මිතුරන් වෙත යැවීම

a) A – පමණි
b) B – පමණි
c) A හා B පමණි
d) A හා C පමණි

9. ගොනුවේ විශාලත්වය වැඩි ම වන්නේ පහත සඳහන් කවරක ද.?
a) මෙගාබයිට් 1 ක් වූ .doc ගොනුව
b) කිලෝබයිට් 912 ක් වූ .gif ගොනුව
c) බයිට් 700 ක් වූ .txt ගොනුව
d) බයිට් 1024 ක් වූ .jpg ගොනුව

10. පරිගණකයක මධ්‍ය සැකසුම් ඒකකය පහත දක්වා ඇති කවරකින් සමන්විත වේද.?
a) අංක ගණිතමය හා තාර්කික ඒකකය / පාලන ඒකකය / සංදර්ශකය
b) අංක ගණිතමය හා තාර්කික ඒකකය / පාලන ඒකකය / ආදාන ප්‍රතිදාන උපක්‍රම
c) අංක ගණිතමය හා තාර්කික ඒකකය / පාලන ඒකකය / මතක රෙජිස්ටර්
d) අංක ගණිතමය හා තාර්කික ඒකකය / පාලන ඒකකය / ද්වීතියික ආචයනය

11. මධ්‍ය සැකසුම් ඒකකයේ රික්තක නල ට්‍රාන්සිස්ටර් මගින් ද ඉන් අනතුරුව ට්‍රාන්සිස්ටර් අනුකලිත පරිපථ මගින් ද ප්‍රතිස්ථාපනය වීමේ ප්‍රතිඵලය වුයේ කුමක්ද.?
a) සැකසුම් බලය හා විදුලිබල පාරිභෝජනය යන දෙක ම ඉහළ යාම
b) සැකසුම් බලය ඉහළ යාම හා විදුලිබල පරිභෝජනය පහළ
c) සැකසුම් බලය පහළ යාම හා විදුලි පරිභෝජනය ඉහළ යාම
d) සැකසුම් බලය හා විදුලිබල පරිභෝජනය යන දෙකම පහළ යාම

12. පහත දැක්වෙන උපාංග සළකන්න
A – මූසිකය  B – ස්පර්ශ තිරය  C – ලිවිය හැකි බාහිර DVD ධාවකය
ඉහත කුමන උපක්‍රම ආදාන හා ප්‍රතිදාන යන දෙක ම සඳහා භාවිතා කළ හැකි ද.?
a) A හා B පමණි  b) A හා C පමණි  c) B හා C පමණි  d) A,B,C යන සියල්ලම

13. පහත සඳහන් කුමන සන්නිවේදන මාධ්‍ය ආලෝක පරාවර්තනය කිරීම මගින් දත්ත සම්ප්‍රේක්ෂණය සිදු කරයි ද.?
a) නොවැසූ ඇඹරුම් කම්බි යුගල
b) ප්‍රකාශ තන්තු
c) සමාක්ෂ කේබල
d) වැසුණු ඇඹරූ කම්බි යුගල

14. සමහර උපක්‍රම ආදාන හෝ ප්‍රතිදාන ලෙස ක්‍රියාකරන අතර තවත් සමහරක් ආදාන හා ප්‍රතිදාන යන දෙයාකාරයටම ක්‍රියා කරයි. පහත උපකරණ අතුරින් ප්‍රතිදාන උපක්‍රම ලෙස පමණක් ක්‍රියා කරයි ද.?
a) ස්පර්ශක තිරය හා සුපරීක්ෂකය
b) මුද්‍රණ යන්ත්‍රය හා වෙබ් කැමරාව
c) මුද්‍රණ යන්ත්‍රය හා ස්පීකරය
d) ස්පර්ශක තිරය හා තීරු කේත කියවනය

Sudesh Priyankara

15. පහත වගන්ති සළකන්න.

A – පරිගණක රෙජිස්තර මතකය ධාරිතාව දෘඪ තැටියක ධාරිතාවයට වඩා කුඩා වේ

B – මතක රෙජිස්තර වල දත්ත ප්‍රවේශ වේගය දෘඪ තැටියක වේගයට වඩා අඩු වේ

C – මතක රෙජිස්තර වල දත්ත ආවයනය සඳහා බිටුවකට යන වියදම දෘඪ තැටියේ දත්ත ආවයනය සඳහා බිටුවකට යන වියදමට වඩා වැඩිය

ඉහත වගන්ති අතුරින් සත්‍ය වන්නේ

a) A හා B පමණි b) A හා C පමණි c) B හා C පමණි A,B හා C යන සියල්ලම

16. පරිගණකයක් තුළ කල් පමතින සේ දත්ත ආවයනය කිරීම සඳහා වඩාත් යෝග්‍ය වන්නේ කුමක් ද.?

a)නිහිත මතකය(cashe memory) b) දෘඪ තැටිය c) සසම්භාවී ප්‍රවේශ මතකය d) වීඩියෝ මතකය

17. ආදාන උපක්‍රම පමණක් නොමැත්තේ කුමක ද.?

a) යතුරු පුවරුව / තීරු කේත කියවනය / CD ROM / සමතල සුපරීක්සකය

b) යතුරු පුවරුව / වෙබ් කැමරාව / ස්පර්ශ තිරය / සමතල සුපරීක්සකය

c) ආලෝක පෑන / යතුරු පුවරුව / ස්පර්ශ තිරය / මයික්‍රෝෆෝනය

d) මූසිකය / වෙබ් කැමරාව / ස්පර්ශ තිරය / CCTV කැමරාව

18. මධ්‍ය සැකසුම් ඒකකයේ වේගය මනිනු ලබන්නේ

a) ගිගාබයිට් ( GB ) b) ගිගාහර්ට්ස් (GHz) c)තත්පරයට මෙගාබිටු (Mbps) d) මිනිත්තුවට පරිභ්‍රමණ (RPM)

19. පරිගණකයේ දෘඪ තැටිය අකර්මන්‍යවීම් වලින් ආකර්ෂා කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි හොඳ පුරුද්දක් වන්නේ පහත කවරක් ද.?

a) ගිණිපවුර ( firewall ) ස්ථාපනය b) ප්‍රතිවෛරස මෘදුකාංග ස්ථාපනය

c) කාලීනව උපස්ථ (backup) ලබා ගැනීම d) ප්‍රබල මුරපදයක් භාවිතා කිරීම

20. සුපිරි පරිගණක , උකුල් පරිගණක හා ටැබ්ලට් පරිගණක අතුරෙන් පහත සඳහන් යෙදුම් අවස්ථා සඳහා වඩාත්ම යෝග්‍ය පරිගණක ප්‍රරූපය තෝරන්න.

A – චන්ද්‍රිකා මගින් අඛණ්ඩව ලබා ගන්න අති විශාල දත්ත ප්‍රමාණයක් සැකසීමට

B – තම නිවසින් බැහැරව නිවාඩුව ගත කරන ලේඛකයකුට ලිපියක් ලිවීම සඳහා

C – ලැබෙන අයිතම ඉල්ලීම් ඇතුළත් කිරීමට වෙළඳසැල්වලට පැමිණෙන ජංගම වෙළඳ නියෝජිතයකුගේ භාවිතය සඳහා

a) A : උකුල් පරිගණක B : සුපිරි පරිගණක C : ටැබ්ලට් පරිගණක

b) A : උකුල් පරිගණක B : ටැබ්ලට් පරිගණක C : සුපිරි පරිගණක

c) A : සුපිරි පරිගණක B : උකුල් පරිගණක C : ටැබ්ලට් පරිගණක

d) A : ටැබ්ලට් පරිගණක B : සුපිරි පරිගණක C : උකුල් පරිගණක

21. A හා B හිස්තැන් සහිත පහත ප්‍රකාශ සලකන්න

සැකසීමේ කාර්යය කරන විට මධ්‍ය සැකසුම් ඒකකය එහි ….A…. භාවිතා කරන්නේ ….B…. ගෙන එන ලද දත්ත තාවකාලිකව ආවයනය කිරීම සඳහා ය. A හා B සඳහා වඩාත් නිවැරදි වන්නේ

a) ප්‍රාථමික මතකය / රෙජිස්තරවලින්

b) රෙජිස්තර / ප්‍රාථමික මතකයෙන්

c) ද්විතීක මතකය / ප්‍රාථමික මතකයෙන්

d) ද්විතීක මතකය / රෙජිස්තරවලින්

22. සම්ප්‍රේක්ෂණ මාධ්‍ය සම්බන්ධයෙන් පහත කවරක් නිවැරදි වන්නේ

A – 200 m ඉක්මවා දිගු දුරකට දත්ත සම්ප්‍රේක්ෂණය සඳහා නොවැසුණු ඇඹරි යුගල ( UTP ) කේබල සුදුසු වේ

B – ප්‍රකාශ තන්තු කේබලවල දත්ත සම්ප්‍රේක්ෂණය UTP කේබල වලට වඩා වේගවත් වේ

C – රැහැන් රහිත යතුරු පුවරු හා පරිගණක අතර සන්නිවේදනය සඳහා අධෝරක්ත දත්ත සම්ප්‍රේක්ශණය යොදා ගැනේ

a) B පමණි b) C පමණි c) B හා C පමණි d) A,B,C සියල්ම

23. ප්‍රවේශ වේගය අනුව දී ඇති ආවයන සංරචක අවරෝහණ පිළිවෙළට සකසා ඇති වරණය කුමක් ද.?

a) නිහිත මතකය / ප්‍රධාන මතකය / රෙජිස්ටර් / දෘඪ තැටිය

b) දෘඪ තැටිය / නිහිත මතකය / රෙජිස්ටර් / ප්‍රධාන මතකය

Sudesh Priyankara

c) රෙජිස්ටර් / නිහිත මතකය / ප්‍රධාන මතකය / දෘඪ තැටිය
d) රෙජිස්ටර් / ප්‍රධාන මතකය / දෘඪ තැටිය / නිහිත මතකය

24. පහත සඳහන් කවර කාණ්ඩයක් ආදාන උපක්‍රමවලින් පමණක් සමන්විත වන්නේ ද?
   a) තීරු කේත කියවනය ( Barcode Reader ) / ලකුණුකරණය ( Plotter ) / වෙබ් කැමරාව
   b) තීරු කේත කියවනය / කැතෝඩ කිරණ නළය සහිත තිරය ( CRT Monitor ) / මෙහෙයුම් යටිය ( Joystick )
   c) යතුරු පුවරුව / මූසිකය / සුපරික්සකය
   d) බහුමාධ්‍ය ප්‍රක්ෂේපකය / මුද්‍රකය / සුපරික්සකය

25. දත්ත ස්ථිර වශයෙන් ආචයනය කිරීම සඳහා පහත සඳහන් දෑ අතුරින් කවරක් භාවිතා කළ නොහැකි වන්නේ ද?
   a) දෘඪ තැටිය
   b) චුම්බක පටිය
   c) සසම්භාවී ප්‍රවේශ මතකය (RAM)
   d) සැනෙලි මතකය( USB Flash Drive )

26. පරිගණක පද්ධතිවල දත්ත මිනුම් ඒකක ඒවායේ විශාලත්වය අනුව ආරෝහණ පටිපාටියට දක්වන්නේ පහත කවරක් මඟින් ද.?
   a) බිටුව / බයිටය / කිලෝබයිටය / ටෙරාබයිටට
   b) බයිටය / බිටුව / කිලෝබයිටය / ටෙරාබයිටය
   c) මෙගාබයිටය / කිලෝබයිටය / බිටුව / බයිටය
   d) ටෙරාබයිටය / ගිගාබයිටය / මෙගාබයිටය / කිලෝබයිටය

27. මේස පරිගණකයක් තුළ පවතින ආචයන උපක්‍රම ඒවායේ ආචයන ධාරිතාවය අනුව අවරෝහණ පටිපාටියට දක්වන්නේ කුමකින් ද?
   a) රෙජිස්තර / නිහිත මතකය / දෘඪ තැටිය
   b) දෘඪ තැටිය / සසම්භාවී ප්‍රවේශ මතකය / රෙජිස්තර
   c) සසම්භාවී ප්‍රවේශ මතකය / නිහිත මතකය / දෘඪ තැටිය
   d) සසම්භාවී ප්‍රවේශ මතකය / නිහිත මතකය / දෘඪ තැටිය

28. පරිගණක පද්ධතියක ද්විතීයික මතකය සම්බන්ධයෙන් නිවැරදි වන්නේ පහත සඳහන් කවරක් ද?
   A – පරිගණකය ක්‍රියාවිරහිත කළ ද දත්ත මැකී නොයයි
   B – ඝන අවස්ථා උපක්‍රම ද්විතීයික මතකය සඳහා භාවිතා කළ හැකිය
   C – ද්විතීයික මතකය, CPU මතකයේ කොටසකි
   a) A හා B පමණි
   b) A හා C පමණි
   c) B හා C පමණි
   d) A,B හා B සියල්ලම

29. පරිගණක පද්ධතියක දී ඇති ආචයන සංරචක ඒවායේ ආචයන ධාරිතාවයට අනුව අවරෝහණ පිළිවෙළට පහත සඳහන් කුමන පිළිතුර මඟින් නිවැරදිව පෙන්වනු ලබන්නේ ද?
   a) දෘඪ තැටිය / නිහිත මතකය / ප්‍රධාන මතකය
   b) දෘඪ තැටිය / ප්‍රධාන මතකය / නිහිත මතකය
   c) ප්‍රධාන මතකය / නිහිත මතකය / දෘඪ තැටිය
   d) ප්‍රධාන මතකය / දෘඪ තැටිය / නිහිත මතකය

Suresh Priyankara